# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2055/54 - 2018 ජනවාරි මස 26 වැනි සිකුරාදා - 2018.01.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

එල්. ඩී. බී. 123/48 - (iii)

**(105 වැනි අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනත**

(105 වැනි අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනතේ 72 වැනි වගන්ති සමග කියවිය යුතු 19 (ඉ) වගන්තිය යටතේ සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විමසා සහ වෛද්‍ය ආඥාපනත යටතේ ලියාපදිංචිය ලබා ගැනීමට යම් තැනැත්තෙකුට යම් සුදුසුකමක් පිරිනමන හෝ ප්‍රදානය කරන එක් එක් විශ්වවිද්‍යාලයක හෝ ආයතනයක අදහස් සැලකිල්ලට ගෙන සාදන ලද නියෝග.

**රාජිත සේනාරත්න,**
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය
වෛද්‍ය අමාත්‍ය.

2018 ජනවාරි මස 25 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

1. (1) මේ නියෝග 2018 අංක 01 දරන වෛද්‍ය (වෛද්‍ය අධ්‍යාපනයේ අවම ප්‍රමිති පවත්වාගෙන යාම) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) මේ නියෝගවල විධිවිධාන, පාර්ලිමේන්තුවේ අනුමතය පිළිබඳ නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

2. යම් විශ්වවිද්‍යාලයක හෝ ආයතනයක, වෛද්‍ය අධ්‍යාපනය සඳහා වූ අවම ප්‍රමිති මෙහි උපලේඛනයේ දක්වා ඇති පරිදි විය යුතු ය.

3. තනිව හෝ අනුබද්ධව හෝ යුග්ම වෛද්‍ය පාඨමාලාවක් යටතේ යම් පිළිගත් ශ්‍රී ලාංකික හෝ විදේශීය විශ්වවිද්‍යාලයක් හෝ ආයතනයක් සමග ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත වෛද්‍ය අධ්‍යාපන සුදුසුකමක් පිරිනමන හෝ ප්‍රදානය කරන සෑම පිළිගත් විශ්වවිද්‍යාලයක් ම හෝ ආයතනයක් ම මෙහි උපලේඛනයේ දක්වා ඇති අවම ප්‍රමිති, එම විශ්වවිද්‍යාලය හෝ ආයතනය විසින් වෛද්‍ය අධ්‍යාපනය ලබා දීමේ දී පිළිපදින බවට සහ පවත්වාගෙන යන බවට සහතික කළ යුතු ය.

4. මෙම නියෝගවල කාර්ය සඳහා -

"වෛද්‍ය අධ්‍යාපනය" යන්නට වෛද්‍ය ආඥාපනතේ 19 ඉ වගන්තිය යටතේ එයට දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"පිළිගත් විශ්වවිද්‍යාල" යන්නට වෛද්‍ය ආඥාපනතේ 19ඉ වගන්තිය යටතේ එයට දී ඇති අර්ථයම තිබිය යුතු ය; සහ

"යුග්ම වෛද්‍ය පාඨමාලාව" යන්නෙන් වෛද්‍ය විද්‍යා සුදුසුකමක් ස්වාධීනව ප්‍රදානය කරන්නා වූ හා එකිනෙකින් වෙන් වූ පිළිගත් විශ්වවිද්‍යාල හෝ ආයතන දෙකක් විසින් එකම රටෙහි හෝ වෙනස් රටවල් දෙකක මෙහෙයවන්නා වූ වෛද්‍ය විද්‍යා අධ්‍යාපන සුදුසුකමක් ප්‍රදානය කිරීමට මග පෙන්වන වැඩසටහනක් හෝ පාඨමාලාවක් අදහස් වේ.

### උපවගන්තිය

(2 වන නියෝගය)

**මෙහෙවර සහ ප්‍රතිඵල:**

1. වෛද්‍ය අධ්‍යාපනය ලබා දෙන සෑම විශ්වවිද්‍යාලයක ම හෝ ආයතනයක ම සහභාගීත්වයෙන් සකස් කරන්නා වූ මෙහෙවරක් තිබිය යුතු ය. මෙහෙවර ප්‍රකාශය මගින් -

(අ) ප්‍රජාවගේ සෞඛ්‍ය අවශ්‍යතා සහ සෞඛ්‍ය ආරක්ෂණ පද්ධතිය;
(ආ) වෛද්‍ය පර්යේෂණ;
(ඇ) සමාජ වගකීම, වෘත්තීයභාවය සහ ආචාර ධර්ම; සහ
(ඈ) ජාත්‍යන්තර සෞඛ්‍ය,

ආවරණය විය යුතු ය.

2. අධ්‍යාපන ක්‍රමෝපාය -

(අ) සෞඛ්‍ය අංශය තුළ වෛද්‍ය වෘත්තිකයකුගේ භූමිකාව භාර ගැනීමක්;
(ආ) වෛද්‍ය විද්‍යාවේ යම් අංශයක අනාගත වෘත්තියක්;
(ඇ) යම් පශ්චාත් උපාධි වෛද්‍ය පුහුණුවක්; සහ
(ඈ) ජීවිතාන්තය දක්වා වූ ඉගෙනීමට කැපවීමක්,

සඳහා පදනමක් විය යුතු මූලික මට්ටමේ වෛද්‍ය වෘත්තිකයන් බිහි කිරීම උදෙසා නිර්මාණය විය යුතු ය.

3. (අ) විෂය මාලාවේ නිර්මිතය සහ අන්තර්ගතය සහ එහි ඇගයීමට; සහ
(ආ) එය ක්‍රියාත්මක කිරීමට වෙන් කරන ලද මූල්‍ය සහ මානව සම්පත්වල උපයෝගීතාවට,

අදාළව ප්‍රතිපත්ති සැකසීමට සහ ක්‍රියාත්මක කිරීමට විශ්වවිද්‍යාලයට හෝ ආයතනයට ආයතනික වශයෙන් ස්වාධීනත්වයක් තිබිය යුතු අතර, විශ්වවිද්‍යාලය හෝ ආයතනය විසින් එය පවත්වාගෙන යා යුතු ය.

ඉහත කාර්ය සඳහා, විෂය මාලාවේ නව වෙනස් කිරීම් සහිතව අපේක්ෂිත අධ්‍යාපනික ප්‍රතිඵල ලබාගැනීම සහතික කිරීම සඳහා, විෂය මාලාව සහ වැඩසටහන් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීමට වගකීම හා බලය ඇති, සහ එහි වගකීම පැවරෙන, වෛද්‍ය අධ්‍යයන ප්‍රධානියාගේ නායකත්වය යටතේ වූ කාරක සභාවක්, විශ්ව විද්‍යාලය හෝ ආයතනය විසින් පිහිටුවිය යුතු වේ. කමිටුව විසින්, වෛද්‍ය උපාධිධාරීන් කටයුතු කිරීමට අපේක්ෂිත පරිසරයෙන් අවශ්‍ය දැනුම හා තොරතුරු ලබා ගත යුතු අතර ඒ අනුව, සුදුසු විට දී, එම වැඩසටහන් නවීකරණය කළ යුතු ය. ප්‍රතිපත්ති සැකසීමේ දී සහ ක්‍රියාත්මක කිරීමේ දී කමිටුව විසින්, විශේෂයෙන් ම, විෂය මාලාව නිර්මාණය කිරීමේ දී, කළමණාකරණය කිරීමේ දී සහ ඇගයීමේ දී සහ ශිෂ්‍යයන්ට අදාළ වෙනත් කරුණු වලදී ශිෂ්‍ය නියෝජිතයන්ගේ සහභාගීත්වය ලබා ගත හැකි ය.

**අධ්‍යාපනික වැඩසටහන:**

4. ඉගැන්වීම් සහ ඉගෙනීමේ ක්‍රමවේද සමග,

(අ) අවශ්‍ය සායනික නිපුණතා සහ අදාළ න්‍යායාත්මක කරුණු සම්බන්ධයෙන් මනා දැනුමක් ඇති ශක්‍ය සහ කාරුණික වෛද්‍ය වෘත්තිකයන් බිහි කිරීම;

(ආ) විද්‍යාත්මක ක්‍රමවේදය සහ සාක්ෂි මත පදනම් වූ වෛද්‍ය විද්‍යා මූලධර්ම ඇතුළු විශ්ලේෂණාත්මක සහ විවේචනාත්මක චින්තනය දියුණු කිරීම සඳහා පර්යේෂණ කුසලතා වර්ධනය කිරීම;

(ඇ) වෛද්‍ය විද්‍යාවේ මානුෂීය පරිචය සඳහා අවශ්‍ය ආචාර ධර්ම සහ වෘත්තීමය හැසිරීම ඇති කිරීම;

(ඈ) ජීවිතාන්තය දක්වා වූ ඉගෙන ගන්නා තැනැත්තන් බිහි කිරීම සඳහා ස්වයං කාල්පනික සහ ස්වයං අධ්‍යාපනික නිපුණතා ඇති කිරීම,

සඳහා නිර්මාණය කරන ලද නිසිලෙස සැකසූ, පරිපූර්ණ විෂය මාලා ආකෘතියක් පැවතිය යුතු වන අතර, එය සමානාත්මතා මූලධර්මයට අනුව ක්‍රියාත්මක කළ යුතු ය.

5. විශ්වවිද්‍යාලයක හෝ ආයතනයක විෂය මාලාවට, අනිකුත් දේ අතර ට, -

(අ) සායනික විද්‍යා දැනුම ලබා ගැනීම සහ භාවිතයට අවශ්‍ය විද්‍යාත්මක දැනුම, සංකල්ප සහ ක්‍රමවේද අවබෝධ කර ගැනීම සඳහා, මූලික ජීව වෛද්‍ය විද්‍යා විෂයෙහි කරුණු දායක කරගත යුතු ය. මූලික ජීව වෛද්‍ය විද්‍යා යන්නට සායනික විද්‍යා සඳහා ප්‍රමාණවත් පදනමක් සැපයීමට අවශ්‍ය වන කායවිච්ඡේද විද්‍යාව, ජීව රසායන විද්‍යාව සහ පෝෂණ වේදය, සෛල ජීව විද්‍යාව, ජාන විද්‍යාව, ප්‍රතිශක්තිකරණ විද්‍යාව, ක්ෂුද්‍රජීව විද්‍යාව, බැක්ටීරියා හා දිලීර විද්‍යා, පරපෝෂිත ජීවීන් පිළිබඳ විද්‍යාව සහ වෛරස වේදය, අණුක ජීව විද්‍යාව, ව්‍යාධි වේදය, ඖෂධ වේදය සහ භෞතික වේදය ද ඇතුළත් වේ.

(ආ) (i) මානව විද්‍යාවේ, මනෝ විද්‍යාවේ සහ සමාජ විද්‍යාවේ වෛද්‍ය විද්‍යාත්මක පැතිකඩ ඇතුළත් මානව චර්යා සහ සමාජ විද්‍යාවන්ගෙන්;

(ii) ජීව සංඛ්‍යාලේඛන, වසංගත රෝග විද්‍යාව, ජාත්‍යන්තර සෞඛ්‍ය, මූලික සෞඛ්‍ය, සෞඛ්‍යාරක්ෂාව සහ සෞඛ්‍ය ප්‍රවර්ධනය සහ සමාජ සහ නිවාරණ වෛද්‍ය විද්‍යාව ඇතුළත් වන්නා වූ ප්‍රජා වෛද්‍ය සහ ප්‍රජා සෞඛ්‍යයෙන්;

(iii) වෛද්‍යවරුන්ගේ හැසිරීම සහ තීරණ ගැනීමට සම්බන්ධ සාරධර්ම, අයිතිවාසිකම් සහ වගකීම් වැනි වෛද්‍ය පරිචයෙහි සදාචාරාත්මක ගැටලුවලට අදාළ වෛද්‍ය ආචාර ධර්ම වලින්; සහ

(iv) සෞඛ්‍ය සේවා සැපයුම් ක්‍රමවේදයට, සෞඛ්‍ය සේවා වෘත්තියට සහ වෛද්‍ය පරිචයට අදාළ නීති සහ වෙනත් නියෝග සම්බන්ධයෙන් වන වෛද්‍ය විද්‍යාවෙන්, සායනික අධිකරණ වෛද්‍ය විද්‍යාවෙන් සහ අධිකරණ ව්‍යාධි වේදයෙන්,

කරුණු දායකකර ගත යුතු ය.

මේ කාර්ය සඳහා, ශිෂ්‍යයන් විසින්, ප්‍රාථමික සත්කාරය, සෞඛ්‍ය ප්‍රවර්ධනය සහ නිවාරණ වෛද්‍ය විද්‍යාවෙහි නිරත වීම සඳහා ප්‍රජා/ප්‍රථම සන්නිවේදන සත්කාරක සේවා පසුබිමක අවම වශයෙන් පැය දෙසීයක කාලසීමාවක් සහ සායනික අධිකරණ වෛද්‍ය විද්‍යාව සහ අධිකරණ ව්‍යාධි වේදය සම්බන්ධයෙන් අවම වශයෙන් පැය පනහක සැලසුම්ගත අධ්‍යාපනයක් ලැබිය යුතු ය.

(ඇ) උපාධිය ලැබීමෙන් පසු යෝග්‍ය පරිදි වෘත්තීය වගකීම බාර ගැනීමට අවශ්‍ය ප්‍රමාණවත් දැනුම සහ නිශ්චිත සායනික නිපුණතා ශිෂ්‍යයන් විසින් අත්කර ගන්නා බවට සහතික කරනු වස් සායනික විද්‍යාවන්ගෙන් කරුණු දායක කර ගත යුතු ය. සායනික විද්‍යා යන්නට සාමාන්‍ය වෛද්‍ය කර්මය සහ උපවිශේෂඥතා (උදා: හෘද රෝග විද්‍යාව, ස්නායු රෝග විද්‍යාව), ශල්‍යකර්මය සහ එහි උපවිශේෂඥතා (උදා: විකලාංග, ස්නායු ශල්‍යකර්මය) ස්ත්‍රී රෝග සහ ප්‍රසව රෝග විද්‍යාව, ළමා රෝග විද්‍යාව සහ එහි උප විශේෂඥතා, පවුල් සෞඛ්‍ය වෛද්‍ය විද්‍යාව (සාමාන්‍ය පරිචය), මානසික රෝග විද්‍යාව ඇතුළත් වේ.

මේ කාර්යය සඳහා, ශිෂ්‍යයන් විසින්, අධ්‍යයන වැඩසටහනේ දී රෝගීන්ට සත්කාර කිරීම සඳහා අවශ්‍ය පළපුරුද්ද ලබා ගැනීම සඳහා අදාළ සායනික අවස්ථාවල, ප්‍රමාණවත් රෝගීන් සංඛ්‍යාවක් සමග සැලසුම්ගත සාමාන්‍ය සන්නිවේදනයකින් යුතු අවම වශයෙන් පැය තුන්දහසක අධ්‍යයනයක් කළ යුතු ය. සහ;

(ඈ) පහත දැක්වෙන පරිදි, අවශ්‍ය විට දී උපවිශේෂඥතා සහිතව, ප්‍රධාන සායනික ශික්ෂණයන්හි පුහුණු කාලසීමා යොදා ගත යුතු ය.

(i) රෝහල් පාදක කර ගත් සායනික පුහුණුවේ දී අභ්‍යන්තර වෛද්‍ය කර්මය සහ (හෘදරෝග විද්‍යාව, සමේ රෝග විද්‍යාව, ස්නායු රෝග විද්‍යාව සහ ලිංගාශ්‍රිත රෝග, ලිංගිකව බෝවන රෝග ඇතුළුව) අදාළ උපවිශේෂඥතා සම්බන්ධයෙන් අවම වශයෙන් පැය අටසියයක අධ්‍යයන කාලයක්;

(ii) රෝහල් පාදක සායනික පුහුණුවේදී (නිර්වින්දන වේදය, අක්ෂි වේදය, විකලාංග සැත්කම් සහ උගුර, කණ, නාසය පිළිබඳ විද්‍යාව ඇතුළුව) සැත්කම් සහ ඊට අදාළ විශේෂඥතා සම්බන්ධයෙන් අවම වශයෙන් පැය අටසියයක අධ්‍යයන කාලයක්;

(iii) රෝහල් පාදක සායනික පුහුණුවේ දී ප්‍රසව හා නාරිවේදය සම්බන්ධයෙන් අවම වශයෙන් පැය හාරසියයක අධ්‍යයන කාලයක්;

(iv) රෝහල් පාදක සායනික පුහුණුවේ දී ළමා වෛද්‍ය විද්‍යාව සම්බන්ධයෙන් අවම වශයෙන් පැය හාරසියයක අධ්‍යයන කාලයක් ;

(v) රෝහල් පාදක සායනික පුහුණුවේ දී මනෝ වෛද්‍ය විද්‍යාව සම්බන්ධයෙන් අවම වශයෙන් පැය දෙසීයක අධ්‍යයන කාලයක් ; සහ

(vi) සායනික පුහුණුවේ යෙදී ඉගෙන ගන්නා අවම පැය ගණනට, ප්‍රජා මූලික පසුබිමක ඉගෙන ගන්නා පැය ගණනින් පහෙන් එකකට නොවැඩි ප්‍රමාණයක් ඇතුළත් විය හැකි ය.

6. (අ) මූලික ජීව විද්‍යා, චර්යා සහ සමාජ සහ සායනික විෂයයන් අතර උචිත සම්බන්ධීකරණය සහතික කිරීම සඳහා පාඨමාලාවල අන්තර්ගතය, ප්‍රමාණය සහ අනුපිළිවෙළ සහ අනෙකුත් විෂයය සමගාමී අංග විෂයය මාලාවේ විස්තර කිරීම;

(ආ) අපේක්ෂිත අධ්‍යයන ප්‍රතිඵල ලබා ගැනීමට පහසුකම් සැලසීම සඳහා ඉගෙනුම් සහ ඉගැන්වීම් ක්‍රමවල යහපත් සංකලනයක් සහතික කිරීම;

(ඇ) රෝගියාගේ ආරක්ෂාවට නිසි අවධානය ලබා දෙමින් සායනික පුහුණුව සකස් කිරීම; සහ

(ඈ) අධ්‍යාපනික වැඩසටහන හා උපාධිය ලබා ගැනීමෙන් පසු පුහුණු අදියර හෝ පුහුණු වීම් අතර ක්‍රියාකාරී සම්බන්ධතාවය සුරක්ෂිත කිරීම,

යන කාර්යයන් විශ්වවිද්‍යාලයේ හෝ ආයතනයේ කාර්ය විය යුතු ය.

**ශිෂ්‍යයින් ඇගයීම :**

7. විශ්වවිද්‍යාලය හෝ ආයතනය විසින්, ශිෂ්‍යයින්ගේ කාර්ය සාධනය ඇගයීමේ දී අනුගමනය කළ යුතු මූලධර්ම, ක්‍රමවේද සහ පරිචය සහ කඩඉම් ලකුණු, ශ්‍රේණි ව්‍යුහය සහ නැවත විභාගයට පෙනී සිටීමට හැකි වාර ගණන සකස් කිරීමේ නිර්ණායක නිර්වචනය කිරීම නිශ්චිතව දැක්වීම සහ ප්‍රකාශයට පත් කිරීම කළ යුතු ය. එකී මූලධර්ම ක්‍රමවේද සහ පරිච,

(අ) පැහැදිලිව හා ඵලදායී ලෙස, අපේක්ෂිත අධ්‍යාපනික ප්‍රතිඵල සහ උපදේශන ක්‍රමවේදවලට අනුකූල විය යුතු ය;

(ආ) දැනුම, කුසලතා සහ ආකල්ප ආවරණය කිරීම පිණිස ප්‍රමාණවත් ඇගයීමේ ක්‍රම පරාසයකින් යුක්ත විය යුතු ය;

(ඇ) බාහිර විද්වතුන් විසින් නිරීක්ෂණය කරනු ලැබීමට හැකියාව තිබිය යුතුය; සහ සම්බන්ධතා සට්ටනයකින් තොර විය යුතු ය;

(ඈ) ශිෂ්‍ය ඉගෙනීම ප්‍රවර්ධනය කළ යුතු අතර ශාස්ත්‍රීය ප්‍රගතිය පිළිබඳව ඉගෙනීම හා තීරණ ගැනීම සඳහා මග පෙන්වීමට විධිමත් හා සමාලෝචන කිරීමේ යෝග්‍ය සමබරතාවයක් සැපයිය යුතු ය.

**ශිෂ්‍යයින්:**

8. (අ) විශ්වවිද්‍යාලය හෝ ආයතනය විසින් වාස්තවික මූලධර්ම මත පදනම් වූ ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීමේ ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කළ යුතු අතර ශිෂ්‍යයින් තෝරා ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳ පැහැදිලි ප්‍රකාශයක් කළ යුතු ය. එම ප්‍රතිපත්තිය මගින්, අදාළ රාජ්‍යයේ උසස් අධ්‍යාපන ක්‍රමවේදය, විශේෂ අවශ්‍යතා සහිත ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීමට සහ ශිෂ්‍යයන් එක් වැඩසටහනක හෝ එක් විශ්වවිද්‍යාලයක හෝ ආයතනයක සිට වෙනත් වැඩසටහනකට හෝ වෙනත් විශ්වවිද්‍යාලයකට හෝ ආයතනයකට මාරු කිරීම පිළිබඳව ද සැලකිල්ලට ගත යුතු ය.

(ආ) ශිෂ්‍යයින්, අවම වශයෙන් වසර දොළහක පාසල් කාලයක් සහිතව, ද්විතීයික පාසලෙන් සෘජුවම අධ්‍යාපනික වැඩසටහනට ඇතුළත් වන අවස්ථාවක දී, වෛද්‍ය අධ්‍යාපනික වැඩසටහනෙහි කාල සීමාව අවම වශයෙන් වසර පහක්වත් විය යුතු ය.

(ඇ) විශ්වවිද්‍යාලයක හෝ ආයතනයක වෛද්‍ය උපාධි පාඨමාලාව සඳහා ඇතුළත් කර ගනු ලබන සෑම ශිෂ්‍යයකු ම ශ්‍රී ලංකාවේ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය හෝ ඒ හා සමාන විභාගයකින් ජීව විද්‍යාව, රසායන විද්‍යාව සහ භෞතික විද්‍යාව යන විෂයයන්, ජීව විද්‍යාව සහ රසායන විද්‍යාව යන විෂයයන් සඳහා අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව එකවර එක් අවස්ථාවක දී සමත් ව සිටිය යුතු ය.

(ඈ) විශ්ව විද්‍යාලය විසින් ශිෂ්‍යයින් බඳවා ගැනීමේ ප්‍රමාණය නියම වශයෙන් සඳහන් කරනු ලැබිය යුතු අතර ඊට අදාළව වෛද්‍ය අධ්‍යාපනික වැඩසටහනේ සියලු අදියරයන්හි දී එහි ධාරිතාව සඳහන් කරනු ලැබිය යුතු ය.

(ඉ) විශ්වවිද්‍යාලය හෝ ආයතනය විසින් -

(i) ශිෂ්‍යයන්ගේ ප්‍රගතිය මත පදනම් වූ එම ශිෂ්‍යයන් සඳහා වූ ශාස්ත්‍රීය උපදේශන ක්‍රියා පිළිවෙළක් පවත්වාගත යුතු ය;

(ii) අවශ්‍ය අවස්ථාවල දී ප්‍රතිකාර්මික ඉගැන්වීම් ඇතුළුව ශිෂ්‍ය ආධාර වැඩසටහනක් ඉදිරිපත් කළ යුතු ය;

(iii) උපදේශන සේවයේ දී සහ ආධාර ලබා දීම සම්බන්ධයෙන් රහස්‍යභාවය සහතික කළ යුතු ය; සහ

(iv) ශිෂ්‍ය අධ්‍යාපන කටයුතු, විනෝදාත්මක කටයුතු සහ ශිෂ්‍ය සංවිධාන සඳහා දිරිමත් කිරීම සහ පහසුකම් සැලසීම.

**අධ්‍යයන කාර්ය මණ්ඩලය:**

9. විශ්වවිද්‍යාලය හෝ ආයතනය පිළිබඳ ප්‍රතිපත්ති කරුණු සකස්කර ක්‍රියාත්මක කළ යුතු ය.

(අ) (ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල සම්බන්ධව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පනවන ලද විධිවිධානවලට අනුකූලව) විෂයය මාලාව ප්‍රමාණවත්ව ලබා දීම සඳහා සහ වෛද්‍ය සහ වෛද්‍ය නොවන අධ්‍යයන කාර්ය මණ්ඩලය අතර තුලනය, පූර්ණ කාලීන සහ අර්ධ කාලීන අධ්‍යයන කාර්ය මණ්ඩලය අතර තුලනය සහ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල අතර තුලනය පවත්වාගෙන යාම සඳහා වර්ගය, වගකීම් සහ මූලික ජීව විද්‍යා, චර්යාත්මක සහ සමාජ විද්‍යා සහ සායනික විද්‍යා ගුරුවරුන් අතර අධ්‍යයන කාර්ය මණ්ඩලය තුලනය සංක්ෂිප්තව දක්වාලමින් කාර්ය මණ්ඩලය බඳවා ගැනීම, තෝරා ගැනීම සහ උසස් කිරීම;

(ආ) මූලික ජීව විද්‍යා, චර්යාත්මක සහ සමාජ විද්‍යා සහ සායනික විද්‍යා ඉගැන්වීමේ දී අධ්‍යයන කාර්ය මණ්ඩලයේ වගකීම්; සහ

(ඇ) (i) ඉගැන්වීම, පර්යේෂණ සහ සේවා කර්තව්‍යයන් අතර තුලනයට ඉඩ දෙනු ලබන;

(ii) ඉගැන්වීම්, පර්යේෂණ සහ සේවා සුදුසුකම් කෙරෙහි නිසි අවධාරණය සමග ප්‍රශංසනීය අධ්‍යයන කටයුතු හඳුනා ගැනීම තහවුරු කරනු ලබන;

(iii) ඉගැන්වීමේ දී සහ ඉගෙනීමේ දී සායනික සේවා කර්තව්‍ය සහ පර්යේෂණ යොදා ගැනීම තහවුරු කරන; සහ

(iv) ගුරු පුහුණුව, කාර්ය සාධනය සහ ඇගයීම සඳහා සහය දෙනු ලබන කාර්ය මණ්ඩල කටයුතු සහ සංවර්ධනය.

10. විශ්ව විද්‍යාලය හෝ ආයතනය විසින් -

(අ) ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ අනුබද්ධිත ශික්ෂණ රෝහල්වල සහ වෙනත් සෞඛ්‍ය ආරක්ෂණ සැකසුම්වල විශේෂඥයන්ගේ විස්තෘත පීඨය සැලකිල්ලට ගනිමින් සෑම වෛද්‍ය ශිෂ්‍යයන් දහහතරක් සඳහා එක් ගුරුවරයකු ට නොඅඩු වන පරිදි ගුරු - ශිෂ්‍ය අනුපාතයක් පවත්වා ගත යුතු ය;

(ආ) රෝගී සත්කාරයන්හි නියුක්ත වෛද්‍ය සුදුසුකම්ලාභී කාර්ය මණ්ඩලයේ සියලු දෙනාම අදාළ රටෙහි වෛද්‍ය වෘත්තීන් ලියාපදිංචි කිරීම සඳහා වගකිව යුතු නිලලත් ආයතනය සමග ලියාපදිංචි වී ඇති බවට තහවුරු කර ගත යුතු ය;

(ඇ) අධ්‍යයන කාර්ය මණ්ඩල අවම වශයෙන් අඩක්වත්, ආචාර්ය උපාධි මට්ටමේ පශ්චාත් උපාධි සුදුසුකම්ලාභී ස්ථිර සේවකයන් විය යුතු ය; සහ

(ඈ) කාර්ය මණ්ඩලයේ සියලු සාමාජිකයන් සතුවම වෛද්‍ය විෂයය මාලාවේ සැකැස්ම පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් ඇති බවට වගබලා ගත යුතු ය.

**අධ්‍යාපනික සම්පත්:**

11. විෂයය මාලාව ප්‍රමාණවත් පරිදි ලබාදීම තහවුරු කිරීම සඳහා විශ්වවිද්‍යාලය හෝ ආයතනය සතුව එහි කාර්ය මණ්ඩලය සහ ශිෂ්‍යයන් සඳහා ප්‍රමාණවත් භෞතික පහසුකම් තිබිය යුතු ය.

මෙහි සඳහන් භෞතික පහසුකම් සඳහා පහත පහසුකම් අඩංගු කරනු ලැබිය යුතු ය:-

(අ) යහපත් ධ්වනි උපකරණ සහ ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ සහිතව එක් කණ්ඩායමක මුළු ශිෂ්‍ය සංඛ්‍යාව සඳහා ආසන පහසුකම් සහිතව අවම වශයෙන් දේශන ශාලා දෙකක්; ඕනෑම අවස්ථාවක එක් කණ්ඩායමක සියලු සිසුන් සඳහා ඉඩ පහසුකම් සැලසිය හැකි විභාග ශාලාවක් (ශාලා); සහ ඉගැන්වීම් සහ කුඩා කණ්ඩායම් ක්‍රියාකාරකම් සඳහා කුඩා පන්තිකාමර ප්‍රමාණවත් සංඛ්‍යාවක්; වසරක් සඳහා එක් ශිෂ්‍ය කණ්ඩායමක බඳවා ගැනීම සියයක් වන්නේ නම් අවම වශයෙන් එකක ශිෂ්‍යයන් පහළොවක් සඳහා ආසන පහසුකම් සහිතව දේශන ශාලා/සාකච්ඡා කාමර අවම වශයෙන් දොළහක්, විශාල ශිෂ්‍ය බඳවා ගැනීමක් වන විට මෙම පහසුකම් අනුරූපීව විශාල විය යුතු ය;

(ආ) මූලික ජීව විද්‍යා ඉගැන්වීම් සඳහා, කාර්ය මණ්ඩලයට සහ ශිෂ්‍යයන්ට ආරක්ෂිත වූ ඉගැන්වීමේ පරිසරයක් සහිත සුදුසු රසායනාගාර සහ කෞතුකාගාර; සහ

(ඇ) වෛද්‍ය විද්‍යා ග්‍රන්ථ සහ විමර්ශන ග්‍රන්ථ සහ වාර සඟරාවන්හි වර්තමාන සංස්කරණ සහිත, දේශීය සහ විදේශීය වෛද්‍ය සඟරා සඳහා අන්තර්ජාලය හෝ වෙනත් යම් ආකාරයකින් ප්‍රවේශවීම සඳහා ප්‍රමාණවත් පහසුකම් සහිත පුස්තකාලයක්,

12. විශ්වවිද්‍යාලයට හෝ ආයතනයට, සෑහෙන ප්‍රමාණයක සහ රෝගීන් ප්‍රභේද ද, ප්‍රමාණවත් අධීක්ෂණයක් සහිත සායනික පුහුණු පහසුකම්ද සහිතව ප්‍රමාණවත් සායනික පළපුරුද්දක් සිසුන්ට සැපයීම සඳහා අනුබද්ධිත ශික්ෂණ රෝහල් එකක් හෝ කිහිපයක් යොදා ගත හැකි විශ්වවිද්‍යාලමය හෝ ආයතනික අංශ සහිත එක් ශික්ෂණ රෝහලක් සඳහාවත් ප්‍රවේශය පැවතිය යුතු ය. අනුබද්ධිත ශික්ෂණ රෝහල්, ප්‍රමිති අංක 5 (ඈ) හි නිශ්චිතව දක්වා ඇති අභ්‍යන්තර විද්‍යාව සහ අදාළ විශේෂඥතා (හෘද රෝග විද්‍යා, චර්ම වේදය, ස්නායු වේදය, ලිංගාශ්‍රිත රෝග/බෝවන ලිංගික රෝග ඇතුළත්ව), සැත්කම් සහ අදාළ විශේෂඥතා (නිර්වින්දන වේදය, අක්ෂිරෝග වේදය, විකලාංග සැත්කම් සහ උගුර කන නාසය පිළිබඳ විද්‍යාව ඇතුළත්ව) ප්‍රසව සහ නාරි වේදය, ළමා රෝග සහ නව දරු වෛද්‍ය ප්‍රතිකර්මය සහ මානසික රෝග, හදිසි අනතුරු සහ හදිසි සත්කාර යන ප්‍රධාන සායනික විශේෂඥතාවයන්හි සායනික පහසුකම් වලින් සමන්විත විය යුතු ය.

වසරකට බඳවා ගන්නා කණ්ඩායම සිසුන් සියයක් වන්නේ නම්, විශ්වවිද්‍යාල අංශ (අභ්‍යන්තර වෛද්‍ය විද්‍යාව, සාමාන්‍ය ශල්‍ය, ප්‍රසව හා නාරිවේදය සහ ළමා රෝග ආදියෙහි එක් එක් අංශයන්හි අවම වශයෙන් ඇඳන් සියයක් ද සහ මනෝරෝග අංශයට ඇඳන් තිහක් ද සහිතව) සහ කලින් වර්ෂයේදී 75 % ක අවම ඇඳන් භාවිතයකින් යුතුව අවම වශයෙන් ඇඳන් හත්සියයක් සහිත අනුබද්ධිත ශික්ෂණ රෝහල් එකක් හෝ කිහිපයකින් යුතු විය යුතුය. වැඩි සිසුන් බඳවා ගැනීමක් සඳහා මෙම පහසුකම් සමානුපාතිකව වැඩි විය යුතු ය. ඉගැන්වීම සඳහා එක් අනුබද්ධ රෝහලකට වඩා භාවිත කරන අවස්ථාවක දී, සියලුම රෝහල් සාමූහිකව ශික්ෂණ රෝහලකින් අපේක්ෂිත සේවා, උදාහරණ වශයෙන් ව්‍යාධි වේදය, ජෛව රසායන විද්‍යාව හා ක්ෂුද්‍ර විද්‍යාව සහ විකිරණ වේදය/මූර්ත සේවාවන්හි පර්යේෂණාගාර සේවා සැපයිය යුතු ය.

13. විශ්වවිද්‍යාලයකට හෝ ආයතනයකට ප්‍රමිති අංක 5(ආ) නියම කර ඇති ආකාරයකට, සිසුන්හට ප්‍රමාණවත් ප්‍රජා පාදක සායනික අත්දැකීම් ලබාදීමට ක්ෂේත්‍ර පුහුණුව සඳහා ප්‍රවේශයක් සහ සායනික අධිකරණ වෛද්‍ය විද්‍යා සහ ව්‍යාධි වේද පුහුණුව සඳහා වන ප්‍රවේශයක් තිබිය යුතු ය.

14. සිසුන් සඳහා වන වෙනත් පහසුකම් යන්නට -

(i) ප්‍රමාණවත් අධ්‍යයන ඉඩක්, විවේක ස්ථාන සහ වැසිකිළි;

(ii) තොරතුරු තාක්ෂණික පහසුකම්;

(iii) ක්‍රීඩා සහ විනෝද පහසුකම්;

(iv) විෂය බාහිර ක්‍රියාකාරකම්;

(v) භෝජනාගාර සහ නවාතැන් පහසුකම්;

(vi) සෞඛ්‍ය සත්කාර පහසුකම් සඳහා ප්‍රවේශය; සහ

(vii) ගමනාගමන පහසුකම්.

ඇතුළත් විය යුතු ය.

15. විශ්විද්‍යාල හෝ ආයතන -

(අ) අධ්‍යාපන වැඩසටහන්හි තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය නියමිත අයුරින් භාවිතා කිරීම සිදුකරන;

(ආ) වෛද්‍ය විද්‍යාත්මක පර්යේෂණ සහ අධ්‍යාපනය අතර සබඳතාව පෝෂණය කරන සහ පර්යේෂණ පහසුකම් සහ ප්‍රමුඛතා විස්තර කරන;

(ඇ) නියමකර ඇති අවස්ථාවලදී, විශේෂයෙන්ම වෛද්‍ය විද්‍යා අධ්‍යාපනයේ කාර්යපටිපාටි, පරිචය හා ගැටලු සම්බන්ධයෙන් කටයුතු කරන විෂයමාලා සංවර්ධනයේ දී සහ ශික්ෂණ ක්‍රමවේද හා ඇගයුම් ක්‍රමවේද සංවර්ධනයේ දී, වෛද්‍ය අධ්‍යාපනික විශේෂඥ දැනුම ලබා ගැනීම කෙරෙහි ප්‍රවේශයට සලසන; සහ

(ඈ) වෙනත් අධ්‍යාපනික ආයතන සමග දේශීය සහ ජාත්‍යන්තර සහයෝගීත්වයට මාර්ගය පාදන,

ප්‍රතිපත්තීන් ක්‍රමවත්ව දැක්වීම සහ ක්‍රියාත්මක කිරීම සිදුකළ යුතු ය.

**වැඩසටහන ඇගයීම:**

16. සෑම විශ්වවිද්‍යාලයක් ම හෝ ආයතනයක් ම -

(අ) සතුව එහි අධ්‍යාපනික ක්‍රියාවලිය සහ ප්‍රතිඵලය චර්යා රටානුගතව අධීක්ෂණය කිරීම සඳහා සකස් කළ වැඩසටහනක් තිබිය යුතු ය;

(ආ) (i) විෂය මාලා සහ එහි මූලික අංගවලට අදාළ;

(ii) සිසුන්ගේ ප්‍රගතියට අදාළ කරන;

(iii) ගැටලු හඳුනාගන්නා සහ ඒවාට පිළියම් යොදන; සහ

(iv) විෂය මාලාවට බලපාන ඇගයීමේ අදාළ ප්‍රතිඵලයන් සහතික කරන;

ඇගයීම් වැඩසටහන් සඳහා වන යාන්ත්‍රණයක් ඇති කර එය යොදා ගත යුතු ය.

(ඇ) අධ්‍යාපනික ක්‍රියාදාමයේ අන්තර්ගතය, විෂය මාලාවේ නිශ්චිත අංගයන් සහ සමස්ත ප්‍රතිඵල සහ එහි සාමාජීය වගකීම සම්පූර්ණයෙන් අදාළ කර ගනිමින් එහි අධ්‍යාපනික වැඩසටහන් සෑම වසර පහකදීම ස්වයං ඇගයීමකට ලක් කළ යුතු ය;

(ඈ) ගුරුවරු සහ සිසු ප්‍රතිපෝෂණ ක්‍රමවේද ක්‍රමානුකූලව, සොයා ගැනීම විශ්ලේෂණය කිරීම සහ ප්‍රතිචාර දැක්වීම කළ යුතු අතර වැඩසටහන් සංවර්ධනය සඳහා ප්‍රතිපෝෂණ ප්‍රතිඵල යොදා ගත යුතු ය;

(ඉ) තම අරමුණට සහ අපේක්ෂිත අධ්‍යාපනික ප්‍රතිඵලයට, විෂය මාලාවට සහ සම්පත් සැපයීමට අදාළව සිසුන්ගේ සහ උපාධිධාරීන් සමූහයන්ගේ ක්‍රියාකාරීත්වය විශ්ලේෂණය කළ යුතු ය; සහ

(ඊ) තම අධ්‍යයන කාර්යය මණ්ඩලය සහ සිසුන්, අධ්‍යාපනික වැඩසටහන් කළමනාකරණයෙහි සහ පාලනයෙහි සහ අධීක්ෂණයෙහි සහ ඇගයීමෙහි යෙදවිය යුතු ය.

**පාලනය සහ කළමනාකරණය:**

17. විශ්වවිද්‍යාලය හෝ ආයතනය

(අ) එහි පාලන ව්‍යුහයන් හා කර්තව්‍යයන් සහ අදාළ අවස්ථාවන්හි දී, විශ්වවිද්‍යාලය තුළ ඔවුන්ගේ සබඳතාවය අර්ථ නිරූපණය කිරීම කළ යුතු ය. පාලන ව්‍යුහයන්, කාරක සභා ව්‍යුහය දැක්විය යුතු අතර ශාස්ත්‍රීය මණ්ඩලය, ශිෂ්‍යයන් සහ වෙනත් පරදු තබන්නන්ගේ නියෝජනය පිළිබිඹු කළ යුතු ය;

(ආ) පාලන කාර්යයේ සහ එහි තීරණවල විනිවිදභාවය තහවුරු කළ යුතු ය;

(ඇ) එහි අධ්‍යාපනික වැඩසටහන කළමනාකරණය සඳහා එහි ශාස්ත්‍රීය නායකත්වය පිළිබඳ වගකීම් අර්ථකතනය කළ යුතු ය;

(ඈ) අධ්‍යාපනික අවශ්‍යතා සහ විෂය මාලාව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සම්පත් වෙන් කිරීම සහ වෙන්කළ අධ්‍යාපනික අයවැයක් තුළින් විෂය මාලාවට සම්පත් සැපයීම සඳහා නිරවුල් වගකීම් පෙළක් සහ බලතල තිබිය යුතු ය;

(ඉ) එහි අධ්‍යාපනික වැඩසටහන් සහ අදාළ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා සහය දීමට සුදුසු පරිපාලන සහ වෘත්තීය මණ්ඩපයක් තිබිය යුතු අතර මනා කළමනාකරණය සහ සම්පත් සංවර්ධනය කිරීම තහවුරු කළ යුතු ය; සහ

(ඊ) රජයේ සහ සමාජයේ සෞඛ්‍ය සහ සෞඛ්‍ය සම්බන්ධ අංශ සමග අනුමිත අන්තර් සබඳතා තිබිය යුතු ය.

**අඛණ්ඩ අලුත් කිරීම්:**

18. විශ්වවිද්‍යාලය හෝ ආයතනය විසින් කලින් කල ආයතනික ඇගයීම්/මෙහෙවර ප්‍රතිඵලය, ඇතුළත්කර ගැනීමේ ක්‍රියාවලිය සහ ඒවායේ අදාළත්වය, සම්පත් පහසුකම් සමාලෝචනය කළ යුතු අතර ස්වාධීන ඇගයීම් කණ්ඩායමක් විසින් එවැනි දේ භාරගෙන ඉටු කළ යුතු ය.

19. ක්‍රියාකාරී සහ සමාජ වගකීම් සහිත ආයතනයක් වශයෙන් සෑම විශ්වවිද්‍යාලයක් ම සහ ආයතනයක් ම-

(අ) එහි ව්‍යුහය සහ කර්තව්‍යයන් යාවත්කාලීන කිරීම;

(ආ) එහි අඩුපාඩුකම් නිවැරදි කිරීම; සහ

(ඇ) අඛණ්ඩ අලුත් කිරීම් සඳහා සම්පත් වෙන් කිරීම,

සඳහා ප්‍රතිඵල යොදා ගත හැකි විධිමත් අභ්‍යන්තර පරීක්ෂණ පැවැත්විය යුතු ය.

02 - 383

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.